PN/APIT/2020-01
20.04.2020

# දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
## සේවා යෝජකයන් සහ සේවා නියුක්තිකයන් වෙත කෙරෙන නිවේදනයයි

## සේවා නියුක්තියෙන් ලබන ලැබීම් සහ ලාභ මත අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද අඩු කිරීම

මුදල් අමාත්‍යාංශය විසින් ලබා දෙන ලද උපදෙස් වලට සමගාමීව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් යොමු අංක PN/IT/2020 - 03 (Revised) යටතේ 2020.04.08 දින පළ කරන ලද නිවේදනය මගින් ඔබ වෙත දැනටමත් දන්වා ඇති පරිදි, 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතට සිදු කරන විධිමත් සංශෝධනයනට යටත්ව, පනතේ 83 වන වගන්තිය යටතේ අනිවාර්ය අවශ්‍යතාවයක් වන උපයන විට ගෙවීමේ ක්‍රමය යටතේ සේවායෝජක විසින් වාසික සේවානියුක්තිකයන්ගේ සේවානියුක්ති ආදායමෙන් රඳවා ගැනීමේ බදු අඩුකිරීම, 2020.01.01 දින සිට ඉවත් කර ඇති අතර 2020.04.01 දින සිට බලපැවැත්වෙන පරිදි උපයන විට ගෙවීමේ බද්ද වෙනුවට විකල්ප පදනම මත අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද අඩු කල යුතුය.

ඒ අනුව, සේවා යෝජකයන් විසින්, 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ විධිවිධාන අනුව වාසික තැනැත්තන් වන සේවා නියුක්තිකයන්ගේ එකඟතාවය මත, ඔවුන්ගේ පාරිශ්‍රමිකයෙන් අඩු කර (හෝ වෙනත් යම් ආකාරයකින්) අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද ගෙවිය යුතුය. එම සේවා නියුක්තිකයන් නිර්වාසික තැනැත්තන් වන්නේ නම්, ඔවුන්ගේ එකඟතාවය නොසලකා උපදෙස් මාලාවේ දක්වා ඇති වගු අනුව නියමිත බද්ද අඩු කල යුතුය. වාසික පුද්ගලයන් සඳහා අදාළ වන පරිදිම, නිර්වාසික පුද්ගලයන්ගේ ආදායම මත ද උපරිමය 18% අනුප්‍රමාණයට යටත්ව, ක්‍රමයෙන් වැඩිවන බදු අනුප්‍රමාණ අදාළ වේ. එසේම, නිර්වාසික එහෙත් ශ්‍රී ලංකාවේ පුරවැසියන් වන පුද්ගලයින් තක්සේරු වර්ෂයක් සඳහා රු. මිලියන 3 ක බදු සහනයට හිමිකම් ලබයි.

එම අඩු කරන ලද බද්ද අවසානාත්මක බද්දක් ලෙස නොසැලකිය යුතු අතර, සේවා නියුක්තිකයන් බදු ගෙවන්නා හඳුනා ගැනීමේ අංකයක් සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී, අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද අඩු කිරීම නොසලකා 2019/2020 තක්සේරු වර්ෂයේ සිට ආදායම් බදු වාර්තා ඉදිරිපත් කල යුතුවේ. බදු ලියාපදිංචිය දුරස්ථ ක්‍රමය (online) යටතේ ද ලබා ගත හැකිය.

අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද පිළිබඳ උපදෙස් මාලාව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙන් භාගත කර හැකිය.
දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට බදු ගෙවීම් සිදු කිරීම සඳහා යොමු අංක PN/PMT/2020-1 යටතේ 2020.04.08 දින දේශීය ආදායම් දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පළ කරන ලද නිවේදනය බලන්න.

**දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්**

බදු - වඩා හොඳ අනාගතයකට